PMoE Sabaragamuwa

**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**
**සබරගමුව පළාත් සභාව**

## ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2025/2026

සබරගමුව පළාතේ පාසල්වල සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරී හා අධිසේවක පදනම මත බඳවා ගත් නිලධාරීන්ගෙන් 2026 වර්ෂය සඳහා වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, සබරගමුව පළාත් සභාවට අයත් පාසල්වල 2025.12.31 දිනට එකම පාසලක සේවා කාලය අවුරුදු 08ක් සම්පූර්ණ කළ සෑම විදුහල්පතිවරයෙකුම අනිවාර්යෙන් ස්ථාන මාරු ක්‍රියාවලියට යටත් වන අතර සේවා කාලය වසර 05 හෝ ඊට වැඩි නිලධාරීන් ස්ථාන මාරු අයදුම් කළ යුතුය. එසේ අයදුම්පත් ඉදිරිපත් නොකළහොත් සබරගමුව පළාතේ ඕනෑම ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමති සේ සලකා ක්‍රියා කිරීමට සිදුවනු ඇත.එසේම ප්‍රමුඛතාව හිමිවන්නේ වැඩි සේවා කාලයක් හිමි නිලධාරීන්ට වේ.

03. අයදුම්කරුවන් 2025.07.30 දිනට පෙර සිප්තතු දත්ත පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ යුතුය. ස්ථාන මාරු අයදුම්පත්‍රය www.semis.lk මඟින් මාර්ග ගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණ කළ යුතුය.

04. ස්ථානමාරු අයදුම්පත්‍ර මාර්ග ගත ක්‍රමය ඔස්සේ පමණක් භාර ගන්නා අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා සබරගමුව පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සිප්තතු දත්ත පද්ධතිය ඔස්සේ ස්ථානමාරු අයදුම්පත්‍ර සඳහා නිර්දේශ ලබාදියයුතු බව කාරුණිකව දන්වමි.

05. තව ද,අයදුම්පත් කැඳවනු ලබන දින වන 2025.07.01 දින සිට සබරගමුව පළාත තුළ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාවලිය අත්හිටුවන අතර ස්ථාන මාරු මණ්ඩල තීරණ ප්‍රකාශයට පත් කරන තුරු අභ්‍යන්තර ස්ථානමාරු සිදු නොකරන බව වැඩිදුරටත් දන්වමි.

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර

බී.ඒ.සී.පී.බමුණුආරච්චි,
ලේකම්,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව.

2025/07/01

සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email - edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

මගේ අංකය / எனது இல / My Number: MEDU/AD/06/01/01
ඔබේ අංකය / உமது இல / Your Number:
දිනය / திகதி / Date: 2025/06/30

අමාත්‍යාංශ ලේකම් / Secretary: Office – 045 2223015 Residence – 045 2232985
කාර්යාලය / Office: නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සබරගමුව පළාතේ සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සබරගමුව පළාත් පාසල්වල සියලුම විදුහල්පතිවරුන් වෙත.

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථානමාරු අයදුම්පත්‍ර කැඳවීම - 2025/2026**

සබරගමුව පළාතේ පළාත් පාසල්වල සේවය කරන විදුහල්පතිවරුන්ගේ 2024/2025 වර්ෂයට අදාළව වාර්ෂික විදුහල්පති ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව, සබරගමුව පළාත් සභාවට අයත් පාසල්වල 2025.12.31 දිනට එකම පාසලක සේවා කාලය අවුරුදු 08ක් සම්පූර්ණ කළ සෑම විදුහල්පතිවරයෙකුම අනිවාර්යෙන් ස්ථාන මාරු ක්‍රියාවලියට යටත් වන අතර සේවා කාලය වසර 05 හෝ ඊට වැඩි නිලධාරීන් ස්ථාන මාරු අයදුම් කළ යුතුය. එසේ අයදුම්පත් ඉදිරිපත් නොකළහොත් සබරගමුව පළාතේ ඕනෑම ස්ථානයකට ස්ථාන මාරු ලැබීමට කැමති සේ සලකා ක්‍රියා කිරීමට සිදුවනු ඇත.එසේම ප්‍රමුඛතාව හිමිවන්නේ වැඩි සේවා කාලයක් හිමි නිලධාරීන්ට වේ.

03. මෙම ස්ථාන මාරුවීම් 2026.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිත වේ.

04. එසේම වාර්ෂික විදුහල්පති ස්ථාන මාරුවීම් සඳහා අයදුම්පත් කැඳවීම සිප්තතු දත්ත පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ පමණක් සිදුකරනු ලබන බැවින් ස්ථාන මාරු අපේක්ෂා කරන සෑම විදුහල්පතිවරයෙකුම ඒ සම්බන්ධයෙන් පහත ලබා දී ඇති උපදෙස්වලට අනුකූලවම පමණක් අයදුම් කළ යුතුය.මාර්ගගත ක්‍රමය (Online) යටතේ සකස් කර ඇති අයදුම්පත්‍ර හැර වෙනත් කිසිදු විදුහල්පති ස්ථානමාරු අයදුම්පත්‍ර ආකෘතියක් අයදුම් කිරීම සඳහා භාවිතා නොකළ යුතු අතර, වෙනත් මුද්‍රිත ස්ථානමාරු අයදුම්පත්‍රයක් භාවිතා කළහොත් එම අයදුම්පත්‍රය ඉදිරි කටයුතු සඳහා භාවිතයට නොගන්නා බවද සැලකිය යුතුය.

උපදෙස්:-

I. සිප්තතු දත්ත පද්ධතියට ඇතුල් වීම සඳහා www.semis.lk වෙත පිවිසෙන්න.
II. එහිදී එහි ඇති **Get started** මත **click** කිරීම මඟින් ඔබට සිප්තතු **Login page** වෙත පිවිසිය හැක.
III. එහි **NIC** තීරුවේ ඔබේ හැඳුනුම්පත් අංකය ඇතුළත් කර **Password** තීරුවේ **938263** ඇතුළත් කරන්න.
IV. එවිට ඔබට ලැබෙන **Password** අලුත් කිරීමට ඇති පිටුවේ ඔබේ නව මුරපදය ඇතුළත් කර ඊට පහතින් ඇති තීරුවේ නැවත වරක් නව මුරපදය ඇතුළත් කරන්න.
V. එවිට ඔබ නැවත **Login page** වෙත පැමිණේ. ඉන්පසු නව මුරපදය යොදා ඔබට දත්ත පද්ධතියට ඇතුළත් විය හැකිය.

VI. ඔබට එසේ නව මුරපදය ඇතුළත් කළ පසු එය වැරදි ලෙස පැමිණෙන්නේ නම් ඔබ පාසලට ලබා දී ඇති Excel document හි LOGGIN ERRORS tab මත, ඇතුළත් කිරීමට අවශ්‍ය දත්ත ලබා දී යොමු කරන්න.

VII. ඔබ පද්ධතියට log වූ පසු වම් පසෙහි ඇති My Profile වෙත පිවිසීමෙන් ඔබගේ පෞද්ගලික දත්ත ඔබට බලා ගත හැකිය. එම දත්ත නිවැරදි නොවේ නම් ඔබ පාසලට ලබා දී ඇති Excel document හි PROFILE ERRORS tab වෙත ගොස් අදාළ නිවැරදි දත්ත ඇතුළත් කරන්න. (එම Excel document හි ඇති උදාහරණයට අනුව ඔබේ දත්ත ඇතුළත් කරන්න. නිවැරදි දත්ත නැවත ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ.)

VIII. ඉන්පසු වම් පස ඇති Transfer tab මතට ගොස් ඔබේ Transfer අයදුම්පත පුරවන්න. එම අයදුම්පත්‍රය පුරවා ඔබ වෙත ලැබෙන PDF Document බාගත කොට එය සුරැකිව තබා ගන්න. Transfer අයදුම්පත පිරවීදම්දී ඔබගේ Profile හි වැරදි තිබීම ගැටලුවක් නොවේ. නමුත් එම වැරදි Excel document හි අනිවාර්යෙන් ඇතුළත් කරන්න.

IX. Login වීමට ඇති අපහසුතා සහ Profile Errors අප ලබා දෙන link එක තුළ ඇති Excel Document හි download කළ කොපියක ඇතුළත් කර පහත Email ලිපිනය වෙත යොමු කරන්න. එම Email පණිවිඩයේ subject සඳහා ඔබ පාසලේ census අංකය - ඔබ පාසලේ නම යොදන්න.

❖ උදා: 27245 - රාජකීය විද්‍යාලය , වරකාපොල

Link :https://docs.google.com/spreadsheets/d/1EnM-cS1f53TF5ODX8QEoLUjQKUxr5zMc4LlTLtg8V0/edit?gid=0#gid=0

Email: sipthathu.semis@gmail.com

- Email පණිවිඩය ඔබගේ හෝ පාසලේ Email ලිපිනය හරහා පමණක් යොමු කරන්න.
- එක් පාසලකින් සියලු දත්ත ඇතුළත් එක් Email පණිවිඩයක් පමණක් යොමු කරන්න.
- තොරතුරු නිවැරදි කිරීමේ තදබදයක් ඇතිවිය හැකි බැවින් ඔබ TRANSFER APPLY කරන්නේ නම් පමණක් ජූලි මාසය තුළ ඔබගේ දත්ත නිවැරදි කිරීම් සඳහා යොමු කරන්න.

**මාර්ගගත ක්‍රමය( Online) යටතේ ස්ථානමාරු අයදුම්පත් යොමු කළ යුතු අනිවාර්ය කාල සීමාවන්:-**

- විදුහල්පතිවරුන්ගේ අයදුම්පත් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත 2025.07.30 (2025.07.01 දින සිට 2025.07.30 දින දක්වා) දිනට ප්‍රථම යොමු කළ යුතුය.( මෙම කාලසීමාව ඇතුළත පමණක් මාර්ගගතව අයදුම් කිරීමට අවස්ථාව පවතින අතර,එම කාල සීමාවෙන් පසු අයදුම් කිරීමට ඇති පහසුකම අත්හිටුවනු ලබන බවද සැලකිය යුතුය.)

- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නිර්දේශය සහිත එකී අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් 2025.08.10 දිනට ප්‍රථම ( 2025.07.31 සිට 2025.08.10 දින දක්වා) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතුය.

- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නිර්දේශ කරන ලද එකී අයදුම්පත් 2025.08.15 දිනට ප්‍රථම( 2025.08.10 දින සිට 2025.08.15 දින දක්වා) පළාත් අධ්‍යාපන ලේකම් වෙත යොමු කළ යුතුය.

වෙනත් විශේෂ කරුණු:-

- මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත ඉදිරිපත් කිරීමේදී අදාළ සියලු තොරතුරු නිවැරදිව ඇතුළත් කිරීම විදුහල්පති සේවයේ නිලධාරියා සතු වගකීමකි. එසේ නිවැරදි තොරතුරු ඇතුළත් නොකළ සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධයෙන් විදුහල්පති මාරු මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම තීරණයකට විදුහල්පති සේවයේ නිලධාරියා යටත් වන්නේය.

- සියලුම විදුහල්පති ස්ථාන මාරුවීම්වලට අදාළ ස්ථාන මාරු මණ්ඩල තීරණ සිප්තතු දත්ත පද්ධතිය හරහා පමණක් විදුහල්පති සේවයේ නිලධාරීන් වෙත නිවේදනය කරනු ඇත.

සැලකිය යුතුයි:-

වාර්ෂික විදුහල්පති ස්ථාන මාරු 2025/2026 යටතේ අයදුම්පත් කැඳවනු ලබන 2025.07.01 දින සිට ස්ථාන මාරු ක්‍රියාවලිය අවසන් වන දින තෙක් වාර්ෂික ස්ථාන මාරු අත්හිටවනු ලැබේ. **එවැනි ඉල්ලීම් හෝ අභියාචනා ඉදිරිපත් නොකිරීම විදුහල්පති සේවයේ නිලධාරීන් සතු අනිවාර්ය වගකීමකි. එසේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු නොකරන බව ද අවධාරණය කරමි.**

05.මෙම වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාවලිය ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අගය කොට සලකමි.

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර

**බී.ඒ.සී.පී.බමුණුආරච්චි,**
**ලේකම්,**
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

පිටපත්:-

01.ප්‍රධාන ලේකම්,සබරගමුව පළාත. - **ක.දැ.ගැ.ස.**

02.ආණ්ඩුකාර ලේකම්,සබරගමුව පළාත. - **ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කිරීම සඳහ**